මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

වාර්ෂික වාර්තාව - 2023

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
අංක 01,
ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ -10

දැක්ම

සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්

මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යාලය

අංක 01, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, යන ලිපිනයේ පිහිටි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට අයත් පරිශ්‍රයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා ඇත.

කාර්යාලීය ලිපිනය -

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව,
අංක - 01,
ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ -10

දුරකථන අංකය	-	0112696890 / 0112687109 / 0112674162
ෆැක්ස් අංකය	-	0112680163
විද්‍යුත් තැපැල් ලිපිනය	-	ncrstransport@gmail.com

පටුන

වාර්ෂික වාර්තාව - 2023
(2023.01.01 සිට 2023.12.31)

විස්තරය	පිටු අංකය
හැඳින්වීම	04
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සහා සාමාජික සංයුතිය	05
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය	06
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු	07
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල	08
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්	09 – 20
මාර්ග අනතුරු දත්ත	20 - 21
මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්	22
අවසන් ගිණුම්	23 – 37
විගණකාධිපති වාර්තාව	38 – 45
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	46 - 50

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

හැඳින්වීම

1998 අංක 05 දරන මෝටර් වාහන සංශෝධන පනතේ 213 අ සහ 213 ආ වගන්ති යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇත. ඒ අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන විෂය භාර අමාත්‍යතුමන් විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළුව රාජ්‍ය ආයතන 16 ක සහ එක් රාජ්‍ය නොවන ආයතනයක නියෝජිතයෙකු ඇතුළු නියෝජිතයන් 17 කින් සමන්විත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන මෙම සියලු ආයතන මෙරට ප්‍රවාහන හා මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ වගකිවයුතු රාජ්‍ය ආයතන වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන ආදායම් ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ නියාමන කොමිෂන් සභාව මඟින් නියාමනය වන රක්ෂණ ආයතන මගින් වන අතර, 2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල පිළිබඳව සඳහන් වේ. එහි සඳහන් පරිදි ,"තෘතීය පාර්ශවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් රක්ෂණය කරන සෑම රක්ෂණ ආයතනයක් විසින්ම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදලට වාරික මුදලින් සියයට එකක් (1%) දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය." ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රක්ෂණ සමාගම් තම ආයතන මගින් රක්ෂණය කරනු ලබන තෙවන පාර්ශවීය සියලුම වාහන සඳහා අය කෙරෙන රක්ෂණ ගාස්තු මුදලින් 1% ක වටිනාකමින් යුත් මුදල 2004 දෙසැම්බර් 01 දින සිට බලාත්මක වන පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලට බැර කළ අතර, 2021 සැප්තැම්බර් 17 වන දින ප්‍රවාහන අමාත්‍යතුමිය විසින් නිකුත් කරන ලද අංක 2245/31 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම රක්ෂණ දායකත්ව මුදල 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2% දක්වා වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

මෙම අරමුදල මගින් ඉටු කළයුතු කාර්යභාරයන් පිළිබඳව 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/04 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත. ඉන් එක් වගකිවයුතු ප්‍රධාන කාර්යයක් වනුයේ මාර්ග අනතුරු සිදු කර නොනවත්වා පලා යන වාහන හඳුනාගත නොහැකි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම වාහන අනතුරු වලට ගොදුරු ව මියගිය හෝ ආබාධිත තත්වයට පත් පුද්ගලයන්ට සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීමයි.

මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරු අවම කිරීම, පදික හා මඟී ජීවිත අනතුරු වලට ලක්වීම වළක්වා ගැනීම, මහජනයා දැනුවත් කිරීම ඒ සඳහා අවශ්‍ය නව නීති ඇතුලත් කිරීම හෝ දැනට තිබෙන නීති සංශෝධනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම ඇතුළු සමස්ථයක් ලෙස සියලුම පීඩාකාරී ක්‍රියා බැහැර කරමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයන් සඳහා මෙම අරමුදලෙහි තැන්පත් වන මුදල් ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත.

එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ සියලු පරිපාලන හා අනෙකුත් වියදම් දැරීම ද මෙම අරමුදල මඟින් සිදු කළ යුතුය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා සාමාජිකයන්

01. මලිත් ජයතිලක මහතා - සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
02. ආර්.ඒ.කේ.රේණුකා මිය - ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
03. ටී.සී. පුෂ්පකුමාරි මිය - ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
04. එස්.ජී.සුබසිංහ මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂය සමගාමී හා මාර්ගෝපදේශ උපදේශන සභාව) අධ්‍යාපන අමාත්‍යාංශය
05. ඩී. වත්සලා මාරඹගේ මිය - ජේ. සහකාර ලේකම් (පාලන හා පුහුණු) පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශය
06. ටී.එම්.එස්.කේ. තෙන්නකෝන් මහතා - සහකාර කොමසාරිස් (කාර්මික) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
07. ජේ.අයි.ඩී. ජයසුන්දර මහතා - අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
08. එච්.ඒ.කේ.ඒ.ඉන්දික හපුගොඩ මහතා - නියෝජ්‍ය පොලිස්පති (රථවාහන හා මාර්ග ආරක්ෂාව) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

09. ආචාර්ය එච්.ආර්.පසිඳු මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය
10. එස්.ඩී. අතුකෝරල මිය - අධ්‍යක්ෂ (තත්ව ආරක්ෂණ බාහිර සම්බන්ධතා) ජාතික

ගමනාගමන කොමිෂන් සභාව
11. ධම්මික ආටිගල මහතා - සභාපති, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය
12. ගිහාන් රාමනායක මහතා - සභාපති, ශ්‍රී ලංකා අනතුරු වැලැක්වීමේ සංගමය
13. සී.පී.අයි.ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී , ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
14. ජී.ජී.එම්.කුලතිලක මහතා - ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
15. කේ.එස්.එම්.සමරසේකර මිය - ප්‍රධාන වෛද්‍ය නිලධාරී, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
16. අනුරාධා ගල්ලන්ගොඩ මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයතනික කටයුතු අංශය) මුදල්ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
17. ඩබ්.ඒ.එස්. සුමනසූරිය මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත් සංවර්ධන) නාගරික සංවර්ධන අධිකාරිය
18. ඩී.එම්.කේ.එස්. දිසානායක මහතා - අධ්‍යක්ෂ(ඉංජිනේරු),මහා මාර්ග අමාත්‍යාංශය

19. පී.ඒ.චන්ද්‍රපාල මහතා - අධ්‍යක්ෂ ඉංජිනේරු(රථ වාහන නිර්මාණ හා මාර්ග ආරක්ෂණ), කොළඹ මහ නගර සභාව

20. කේ. චන්ද්‍රකුමාර මහතා - වැඩබලන අධ්‍යක්ෂ (යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව හා රථ වාහන කළමනාකරණය) මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යමණ්ඩලය

01. සභාපති	-	01
02. ලේකම්	-	01
03. ගණකාධිකාරී	-	01
04. සංවර්ධන නිළධාරි	-	10
05. කළමනාකරණ සේවා නිලධාරි	-	01
06. තාක්ෂණ ශිල්පී සහයක	-	01
07. රියදුරු	-	01

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු

- විනය ගරුක හා නීතිගරුක රියදුරන් බිහි කිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- හදිසි අනතුරු නිසා වින්දිත වූ පවුල් සඳහා මූල්‍යාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියාකිරීම.
- මාර්ගය සහ එය භාවිත කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.
- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමග එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.
- මාර්ග අනතුරු නිසා ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු අවම කිරීමට අදාලව ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවර අනුගමනය කිරීම සඳහා මූල්‍යාධාර සහ උපදෙස් ලබාදීම.
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.
- මාර්ග ආරක්ෂාවට අදාල නීති සැකසීම සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු කාර්යභාරය හා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලය ලබා දී ඇත්තේ 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/4 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය මගින් නියෝග කර ඇති පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් සිදුකළයුතු කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

I. රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය.

II. මාර්ග අනතුරු

III. මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන.

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

(ඇ) සම්බන්ධිත විෂයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(ඈ) සම්බන්ධිත විෂයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන අදාල ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඔ) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(එ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම.

2023 <u>වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්</u>

01. මාර්ග ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාකළ පුද්ගලයින් ඇගයීම

2023 අප්‍රේල් මස 8 වෙනිදා සවස කොළඹ සිට බදුල්ල දක්වා ධාවනය වූ දුම්රිය ගමන්ගත් මාර්ගයට හපුතලේ ග්ලැනෝර් වතුයායේ රේල් ගේට්ටුව ආසන්නයේ දැවැන්ත ගසක් පෙරලීම නිසා මාර්ගය අවහිරවී තිබිණි. එහි දී සිදුවීමට ගිය විශාල ජීවිත සහ දේපල විනාශයක් වළක්වා ගැනීමට ක්ෂණිකව ක්‍රියාත්මක වෙමින් දුම්රිය ගමන් ගන්නා මාර්ගයට පැමිණි දුම්රියට අනතුර පිළිබඳ සංඥා කරමින් දුම්රිය නතර කිරීමට කටයුතු කළ තංගමලේ වතුයායේ මුරකරුවකු ලෙස සේවය කරන හපුතලේ එච්.එම්. විජයරත්න මහතා ජීවිතය පවා පරදුවට තබමින් සිදුකළ වීර ක්‍රියාවට උපහාර දැක්වීම සඳහා විශේෂ උත්සවයක් හපුතලේ දුම්රිය ස්ථානයේදී සංවිධානය කර තිබිණි.

විජයරත්න මහතා විසින් සිදුකරන ලද වීර ක්‍රියාව අගය කරමින් ඔහු විසින් කරන ලද මෙහෙවර වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදල් ත්‍යාගයක් පිරිනමන්නට ප්‍රවාහන හා මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ උපදෙස් පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කටයුතු කරන ලදී.

02. **මත්ද්‍රව්‍ය භාවිත කර රිය ධාවනය කරන රියදුරන් හඳුනා ගැනිමේ තාක්ෂණික උපකරණ කට්ටල (Test kit) මිල දී ගැනිමට රුපියල් මිලියන 10 ක මුදලක් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් මත රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාශයේ ලේකම් වෙත ලබාදීම.**

මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය කරන රියදුරන් නීතියේ රැහැනට හසු කර ගැනීම සඳහා වන නියමු ව්‍යාපෘතියක් බස්නාහිර හා දකුණු පලාත තුළ ක්‍රියාත්මක කරන ලදි.

03. **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා කොළඹ නගර සභාව ඒකාබද්ධව මෙහෙය වන පාසල් මාර්ග ආරක්ෂණ අධ්‍යයන ඒකකය සඳහා පාපැදි 20 ක් ලබාදීම.**

2023.05.17 දින මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලින් පාපැදි 20 ක් ලබාදීම හා පාසල් සිසුන් මාර්ග නීති සම්බන්ධයෙන් පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

04. මහර කඩවත වෙසක් කළාපය හා හෝමගම පොසොන් කළාපය පැවැත්වීම.

රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වනු ලැබූ වෙසක් කළාප හා පොසොන් කළාපයන්ට සමගාමීව, මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් විරිදු ගායනා හා වීඩියෝපට යොදාගනිමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් ක්‍රියාත්මක කරන ලදී.

05. 2023.08.12,13 දිනයන්හි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් කුරුණෑගල ශ්‍රීමත් ජෝන් කොතලාවල මධ්‍ය මහා විද්‍යාලයේදී ක්‍රියාත්මක කරන ලද දෙදින ජංගම සේවා වැඩසටහනට සමගාමීව, මාර්ග ආරක්ෂාව හා මාර්ග අනතුරු අවම කරගැනීම සම්බන්ධයෙන් ජංගම සේවා වැඩසටහන සිදු කිරීම.

ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන යටතේ රථවාහන මූලස්ථානයේ වීදි නාට්‍ය කණ්ඩායම යොදවා ගනිමින් නාට්‍යානුසාරයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අත්පත්‍රිකා බෙදාදීම, වීඩියෝ දර්ශන පෙන්වීම හා ජනතාව සමඟ සාකච්ඡා කරමින් මාර්ග අනතුරු වළක්වාගැනීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකරන ලදි.

06. **දින මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව හා මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මාධ්‍ය ආයතනයන්හි කාර්යභාරය පිළිබඳව පහත තේමාවන් මූලික කරගනිමින් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි සේවයෙහි නියුතු මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.**

- සීඝ්‍රයෙන් ඉහළ යන මාර්ග අනතුරු
- සුරක්ෂිත මාර්ග පද්ධතියක් උදෙසා මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යභාරය
- රථවාහන නීතියේ මෑතකාලීන සංශෝධන හා ඉදිරි නෛතික ක්‍රියාමාර්ග
- පසු අනතුරු කළමනාකරණය
- මාර්ග අනතුරු නිවාරණ හා දත්ත විශ්ලේෂණය
- ඉදිරියේදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් කිරිමට නියමිත වැඩසටහන්

07. **අගෝස්තු මස 09 සිට 13 දක්වා ගම්පහ ඌරාපොල මධ්‍ය මහා විද්‍යාලයේ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.**

ඌරාපොල මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

08. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ආයතනික ව්‍යුහය සකස් කිරිම, නව වේගසීමා, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම යන ප්‍රධාන කාරුණු යටතේ ලෝක බැංකුවේ නියෝජිතයන් සමඟ විශේෂ සාකාච්ඡාවක් පවත්වන ලදී.

09. ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා රියදුරු බලපත්‍ර ලබා දීම වැඩසටහනට අදාලව මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

2023.09.25 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවත්වන ලද පූර්ණ ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා සැහැල්ලු වාහන බලපත්‍ර ලබාදීමේ වැඩසටහනට අදාළව ශ්‍රවණාබාධිත පුද්ගලයින්ගේ වාහනවල ඇලවීම සඳහා ශ්‍රවණාබාධිත බව හඟවනු ලබන සංඥාව සහිත ස්ටිකර් මුද්‍රණය කර ලබාදීමට කටයුතු කරන ලදි.

10. ලෝක ළමා දිනයට සමගාමීව පවත්වන මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන විහාරමහා දේවී උද්‍යානයේ ස්ථාපිත මාර්ග ආරක්ෂණ ඒකකයේදී පවත්වන ලදී.

2023 ඔක්තෝම්බර් මස 01 දින පැවැත් වූ අතර මේ සඳහා නිකහැටිකන්ද කණිෂ්ඨ විද්‍යාලය, යටවර කණිෂ්ඨ විද්‍යාලය,බෝපාගම කණිෂ්ඨ විද්‍යාලය, රතඹලේ කණිෂ්ඨ විද්‍යාලය යන පාසල් තුල ඉගෙනුම ලබන 1 හා 2 ශ්‍රේණි සිසුන් 100ක්, ගුරුවරු කිහිපදෙනෙක් හා දෙමාපියන්ද සම්බන්ධ විය.

11. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී අංශය සමඟ එක්ව ජාතික සහ පළාත් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන මාර්ග ආරක්ෂණ සංසද (Road Safety Club) පිහිටුවීම හා එහි සාමාජිකයින් වන පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්හට මාර්ග ආරක්ෂාව පිළිබඳ ලකුණු ලබා දීමේ හා පදක්කම් ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට (අවසානයේ ජනාධිපති පදක්කමක් දක්වා යාමට හැකිවන පරිදි) අදාලව චක්‍රලේඛය සකස් කිරීම හා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට අදාළව වැඩමුළු පැවැත්වීම.

12. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් 17 යටතේ දක්වා ඇති "අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක් ව පාසල් සිසුන් වෙත මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමට අදාළව ක්‍රියාමාර්ග ගැනීම" යටතේ සිදු කිරීමට නියමිත, 6-11 ශ්‍රේණින්ට අයත් විද්‍යා හා ගණිත විෂය නිර්දේශයට, ගුරු අත්පොතට හා පෙළ පොතට මාර්ග අනතුරු සඳහා පසුබිම් වන සෛද්ධාන්තික දැනුම ඇතුලත් කිරීමට සඳහා විශේෂඥ දැනුමැති නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් 2023.10.10 හා 11 යන දෙදින බත්තරමුල්ල ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනයේ වැඩමුළුවක් පවත්වන ලදී.

13. **2023.10.21 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් මඩකළපුව හින්දු විද්‍යාලයේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.**

මාර්ග ආරක්ෂාව හා මාර්ග අනතුරු අවම කරගැනීම සම්බන්ධයෙන් එම වැඩසටහනට සහභාගී වූ ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා බෙදාදීම, වීඩියෝ දර්ශන පෙන්වීම, පාපැදි අනතුරු අවම කිරීම සඳහා පරාවර්ථීත ස්ටිකර් ඇලවීම ඇතුළු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

14. ළදරුවියේ සිටම මාර්ගය හා මාර්ග අනතුරු පිලිබඳව සරළ දැනුවත්භාවයක් හා අවබෝධයක් ලබා දිමේ අරමුණින් පෙර පාසල් තුළ ක්‍රියාත්මක කිරිමට නියමිත සිඟිති මග සර" වැඩසටහන සඳහා, මාර්ග අනතුරු සම්බන්ධ ක්‍රීඩාව (Road Safety Ladder board), ලබා දීමට අදාලව ශක්‍යතා අධ්‍යනයක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිගහමුල සිරිසිදුහත් පෙරපාසලේ හා වැලිවේරියේ Grate Royal පෙරපාසලේ සිසු/සිසුවියන් යොදාගෙන සිදු කරන ලදි.

15. 2023.11.30 දින මාර්ග අනතුරුවලට ලක්වූ වින්දිතයින් සිහිකිරීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහන යටතේ මාර්ග අනතුරු හේතුවෙන් සදාකාලික ආබාධයන්ට ලක්වූ පුද්ගලයින් 25 දෙනෙකු වෙනුවෙන් එක් අයෙකුට **රු.150,000.00** බැගින් මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහනක් පවත්වන ලදී.

16. **2023.12.27,28 හා 29 දිනයන්හී පස්යාල මහා විද්‍යාලයේ ආදි සිසු එකමුතුව විසින් සංවිධානය කරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනයක් පවත්වන ලදී.**
එයට සහභාගී වූ පාසැල් සිසුන්,ජනතාව දැනුවත් කිරීම සඳහා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

17. මෝටර් වාහන (වේග සීමා) නියෝග පැනවීමේ නියමු ව්‍යාපෘතිය

මෝටර් වාහන වේගසීමා නියෝග පැනවීමේ නියමු ව්‍යාපෘතියට අදාළව බස්නාහිර පළාතේ තෝරාගන්නා ලද පහත දක්වා ඇති මර්ගයන්හි හඳුනාගත් සංවේදී කලාප සඳහා වේගසීමා සලකුණු කිරීම සඳහා කටයුතු කරන ලදි.

1. දිවුලපිටිය - ඉඳුරාගාර මාවත
2. වත්තල- මහර මාර්ගය
3. කිරිදිවැල - වතුරගම මාර්ගය
4. ඌරාපොළ - රුවන්වැල්ල මාර්ගය
5. උස්වැටකෙයියාව - එප්පාමුල්ල මාර්ගය

18. <u>හජ්පා පළා ගිය වාහන වලින් අනතුරට පත් වින්දිතයන්ට මූල්‍ය සහන ලබාදීම</u>

ස්ථාවර කමිටුවේ සහ ජාතික සභාවේ අනුමැතිය ලද වින්දිතයින් සඳහා 2023 වර්ෂයට අදාලව අවස්ථා හතරකදී මූල්‍යාධාර ලබා දීම සිදු කරන ලදි.

දිනය	ස්ථානය	වින්දිතයින් ප්‍රමාණය	ගෙවන ලද වන්දි මුදල රු. ලක්ෂ
2023.03.29	මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය	20	3,500,000.00
2023.07.13	මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය	09	1,850,000.00
2023.09.01	මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය	08	1,400,000.00
2023.11.21	මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය	03	550,000.00
එකතුව		40	7,300,000.00

19. 2023 වර්ෂයෙහි දිවයිනේ සිදුවූ රිය අනතුරු සංඛ්‍යාව

වර්ෂය	මාරක	බරපතල	සුළු	අලාභ	එකතුව	මියගිය
2023	**2,171**	**5,561**	**9,169**	**5,903**	**22,804**	**2,280**

2023 වර්ෂයෙහි මියගිය සංඛ්‍යාව

කාණ්ඩය	2023
යතුරුපැදිකරුවන්	742
පසුපැදිකරුවන්	179
පදිකයින්	696
මගීන්	277
රියදුරන්	176
පාපැදිකරුවන්	206
වෙනත්	45
එකතුව	2321

2023 වසර තුල මාරක අනතුරු වලට වගකිව යුතු වාහන

වගකිව යුතු වාහනය	2023
	මාරක අනතුරු
යතුරුපැදි	899
ලොරි	247
ත්‍රීවිල්	258
ජීප්	21
කාර්	173
පුද්ගලික බස්	186
ලංගම බස්	82
ට්‍රැක්ටර්	28
පාපැදි	39
කන්ටේනර්	11
වෑන්	106
කැබ්	97
බවුසර්	05
දුම්රිය	03
බැකෝ යන්ත්‍ර	02
හප්පා පළායෑම්	56
වෙනත්	12
එකතුව	**2225**

මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ ආයතන

01. අමානා ටකාෆුල් රක්ෂණ සමාගම - නො 660 1/1, ගාලු පාර, කොළඹ - 03.

02. අලියාන්ස් රක්ෂණ සමාගම - නො 675, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ - 09.

03. සෙලින්කෝ රක්ෂණ සමාගම - 3 වන මහල, "සෙලින්කෝ නිවාස", නො 69,
ජනාධිපති මාවත, කොළඹ - 01.

04. කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම - නො 79, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ - 07

05. සී./ස. සමූපාකාර රක්ෂණ සමාගම - නො 74/05, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ - 14.

06. එච්.එන්.බී. රක්ෂණ සමාගම - ව්‍යාපාර මධ්‍යස්ථානය, නො 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ - 03.

07. එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම - නො 481, ටී.බී ජයා මාවත, කොළඹ - 10.

08. ජාතික රක්ෂණ භාර අරමුදල - නො 95, UPTO හවුස්, ශ්‍රී චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ -02.

09. එම්.බී.එස්.එල් රක්ෂණ සමාගම - නො 519, ටී.බී ජයා මාවත, කොළඹ - 10

10. ඔරියන්ට් රක්ෂණ සමාගම - නො.133, නව බුලර්ස් පාර,කොළඹ 04.

11. පීපල්ස් රක්ෂණ සමාගම - නො 07, හැව්ලොක් පාර, කොළඹ - 05.

12. සී/ස සණස රක්ෂණ සමාගම - නො. 172, ඇල්විටිගල මාවත, කොළඹ - 08.

13. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම - රක්ෂණ මන්දිරය, නො 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

14. ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම - නො 33, ශාන්ත මයිකල් පාර, කොළඹ 03

මූල්‍ය ප්‍රකාශන - 2023

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2023 රු.	2022 (නැවත සටහන් කළා) රු.
ආදායම			
රක්ෂණ සමාගම් වලින් දායකත්වය	3	74,206,951.08	72,177,175.66
වෙනත් ආදායම්	4	95,754,490.18	59,623,928.59
මුළු ආදායම		**169,961,441.26**	**131,801,104.25**
අඩුකළා - වියදම්			
පරිපාලන වියදම්	5.1	9,183,210.68	11,736,669.91
මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන්	5.2	28,079,309.68	55,131,649.20
වියදමට වඩා ආදායමේ වැඩිවීම		**132,698,920.90**	**64,932,785.14**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2023	2022 (නැවත ප්‍රකාශිත)
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	6	4,385,243.44	3,073,807.79
මුළු ජංගම නොවන වත්කම්		**4,385,243.44**	**3,073,807.79**
භාණ්ඩාගාර බිල්පත්	7	391,124,079.56	321,543,535.44
ස්ථාවර තැන්පතු	8	248,116,174.31	186,550,001.20
ජංගම වත්කම්			
රක්ෂණ සමාගම් වලින් ලැබිය යුතු මුදල්	3	6,947,130.98	6,038,024.51
භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබිය යුතු පොළිය	7	5,301,939.75	7,679,994.18
ලැබිය යුතු ස්ථාවර තුන්පතු පොලිය	8	10,283,869.50	7,885,735.26
පෙරගෙවුම්		-	26,783.09
බැංකුවේ ඇති මුදල්	9	40,627,139.22	47,858,688.01
මුළු ජංගම වත්කම්		**706,785,576.76**	**69,489,225.05**
අඩුකළා - ජංගම වගකීම්			
ගෙවිය යුතු විගණන ගාස්තු		260,820.00	200,000.00
සැපයුම්කරුවන් සඳහා ගෙවීම		-	6,586,736.23
මුද්දර ගාස්තු		200.00	625.00
සිදු කළ යුතු වෙනත් ගෙවීම්		83,349.06	126,921.45
		344,369.06	6,914,282.68
මුළු වත්කම්		**706,441,207.70**	**573,742,286.80**
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදල් ගිණුම			
අරමුදල් ගිණුම් ශේෂය ඉදිරියට ගෙනාවා		573,742,286.80	508,809,501.66
වියදමට වඩා ආදායමේ අතිරික්තය		132,698,920.90	64,932,785.14
මුළු අරමුදල්		**706,441,207.70**	**573,742,286.80**

සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලටම අයත් කොටස් වේ.

සහතිකය

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 දින දක්වා වන කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතිරික්තය /(හිඟය) අපි සහතික කරමු.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මෙම සභාව වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කර අත්සන් කරන ලදී.

ගණකාධිකාරී (රාජකාරී ආවරණ)
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

ලේකම්
N මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
වක්‍ර ක්‍රම මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023	2022
		(නැවත සටහන් කළා)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	රු.	රු
බදු පෙර ලාභය	132,698,920.90	69,109,561.46
ගැලපීම්		
පූර්ව වර්ෂයේ ගැලපීම් (ශුද්ධ)	1,155,044.23	(1,175.00)
අවප්‍රමාණවීම	1,247,764.35	810,629.91
ස්ථාවර වත්කම් ප්‍රදාන	-	3,803,686.15
පොලී ආදායම	(95,754,490.18)	(58,390,437.91)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	39,347,239.31	15,332,264.61
කාරක ප්‍රාග්ධනය වෙ: කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
වෙනත් ලැබිය යුතු ලැබීම් වල වැඩිවීම/(අඩුවීම)	(902,403.19)	(9,061,759.66)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම් වල වැඩිවීම/(අඩුවීම)	(6,569,913.62)	116,127.54
මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්	(7,472,316.81)	(8,945,632.12)
මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල	31,874,922.50	6,386,632.49
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිළට ගැනීම	(3,714,244.23)	(1,224,331.94)
ලැබූ පොළිය	95,754,490.17	58,390,437.91
ස්ථාවර තැන්පත් ප්‍රති ආයෝජන	(61,566,173.11)	(7,643,217.33)
භාණ්ඩාගාර බිල්පත් ප්‍රති ආයෝජන	(69,580,544.12)	(39,162,413.04)
ආයෝජන කටයුතු සඳහා භාවිත ශුද්ධ මුදල	(39,106,471.29)	10,360,475.60
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලැබෙන මුදල්	-	-
දිගුකාලීන ණය ගැනීම් වලින් ලැබෙන මුදල්	-	-
මූල්‍ය බදු බැඳීම් ගෙවීම	-	-
ලාභාංශ ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිත ශුද්ධ මුදල	-	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	**(7,231,548.79)**	**16,747,108.09**
කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	**47,858,688.01**	**31,111,579.92**
කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**40,627,139.22**	**47,858,688.01**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2023 දෙසැම්බර් 31 දිනට
ස්කන්ධය වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

	අරමුදල් ගිණුම රු	එකතුව රු
2A14:D42017/12/31 දිනට ශේෂය	260,040,799.57	260,040,799.57
		-
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරිම)	40,561,344.97	40,561,344.97
2017/12/31 දිනට ශේෂය	300,602,144.54	300,602,144.54
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරිම)	59,487,763.56	59,487,763.56
2018/12/31 දිනට ශේෂය (නැවත ප්‍රකාශ කිරිම)	360,125,892.14	360,125,892.14
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරිම)	61,315,294.39	61,315,294.39
2019/12/31 දිනට ශේෂය	421,441,186.53	421,441,186.53
වියදමට වඩා ආදායමේ අතිරික්තය	61,862,692.11	61,862,692.11
2020/12/31 දිනට ශේෂය	483,303,878.64	483,303,878.64
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරිම)	25,505,623.02	25,505,623.02
2021/12/31 දිනට ශේෂය	508,809,501.66	508,809,501.66
වියදමට වඩා ආදායමේ අතිරික්තය	64,932,785.14	64,932,785.14
2022/12/31 දිනට ශේෂය (නැවත සඳහන් කිරීම)	573,742,286.80	573,742,286.80
වියදමට වඩා ආදායමේ අතිරික්තය	132,698,920.90	132,698,920.90
2023/12/31 දිනට ශේෂය (නැවත සඳහන් කිරීම)	706,441,207.70	706,441,207.70

මාර්ග ආරක්ෂාව සඳහා වූ ජාතික සභාව

2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1 ආයතනික තොරතුරු

1.1 පොදු කරුණු

මෙම සභාව 1998 අංක 5 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනත මගින් ස්ථාපිත කරන ලද අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. සභාව ක්‍රියාත්මකවීම සඳහා රෙගුලාසි මගින් 213(A) අතිරේක නව වගන්තිය හඳුන්වා දෙන ලදී. සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 01, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 හි පිහිටි අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පිහිටා ඇත.

2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමඟ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය, ස්කන්ධය වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිළිබඳ මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

2.2 වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම්

2.2.1 දේපළ, පිරියත සහ උපකරණ

(a) දේපළ, පිරියත සහ උපකරණ වල සමුච්චිත ක්ෂයවීම් අඩු කර ඒවායේ පිරිවැයට අනුව ගිණුම්වල සටහන් කර ඇත. 2018 දී, වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන ලද අතර, එදිනට පැවති වත්කම්වල ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු ධාරණ අගයට අනුව ගිණුම්ල සටහන් කර තිබේ.

(b) ක්ෂයවීම

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල රේඛීය පදනම භාවිතා කරමිනි. අනුපාතිකව වත්කම භාවිතයට ගත හැකි දින සිට එහි ඵලදායී ජීව කාලය පුරා මෙම ප්‍රතිපත්තිය භාවිතා කර තිබේ.

භාවිතා කරන ලද ප්‍රධාන වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

1.	පරිගණක	25%
2.	ඡායා පිටපත්/ මුද්‍රණ යන්ත්‍ර	12.5%
3.	වායු සමීකරණ යන්ත්‍ර	12.5%
4.	යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් වත්කම්	12.5%
5.	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	10%
6.	රියදුරු ඉගෙනුම් යන්ත්‍ර	10%
1.	කැමරා උපකරණ සහ ශීතකරණ	25%
2.	අනෙකුත් මාධ්‍ය උපකරණ	12.5%

දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂයවීම් අනුපාත

2.3 <u>ආයෝජන</u>

මාර්ග ආරක්ෂණ අරමුදලට දායක මුදල් මාසිකව රක්ෂණ සමාගම් වලින් ලැබෙන අතර, අතිරේක අරමුදල් භාණ්ඩාගාර බිල්පත් සහ ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලැබේ.

(a) වර්තමාන ආයෝජන

වර්තමාන ආයෝජන පිරිවැය අනුව දක්වා ඇති අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොලී ආදායම කල් පිරුන පසු නැවත ආයෝජනය කරනු ලැබේ

2.4 බැදීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇති වගකීම්, මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත ඒවා වේ.

2.4.1 <u>වෙනත් කළ යුතු ගෙවීම්</u>

ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඔවුන්ගේ පොත් වටිනාකම්වල දක්වා ඇත.

2.4.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සභාවට වර්තමාන වගකීමක් ඇති විට, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍යා වන අතර, වගකීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගැනේ.

2.5 <u>මාර්ග ආරක්ෂණ අරමුදල - ආදායම්</u>

ලියාපදිංචි වාහන රක්ෂණ සමාගම් දහහතරක් සියලුම තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පු වාරිකවලින් 1% ක් ගෙවන අතර 2021 ඔක්තෝබර් 01 වන දින සිට එය 2% දක්වා වැඩි කෙරේ. රක්ෂණ සමාගම් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඔවුන්ගේ මාසික දායකත්වය ගෙවිය යුතුය.

2.6 <u>කාර්ය මණ්ඩලය</u>

ජාතික මාර්ග ආරක්ෂක ලේකම් කාර්යාලය යනු මාර්ග ආරක්ෂාව සඳහා වන ජාතික සභාවේ ක්‍රියාත්මක කිරීමේ අංශයයි. අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය ප්‍රවාහන අමාත්‍යාංශයෙන් මාර්ග ආරක්ෂක ලේකම් කාර්යාලයට මාරු කර ඇත. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වැටුප ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ.

2.7 <u>දෝෂ</u>

දෝෂයන් සොයා ගැනීමෙන් අනතුරුව, නිකුත් කිරීම සඳහා බලය ලබා දුන් පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළින්,

(අ) දෝෂය සිදු වූ පූර්ව කාල පරිච්ඡේද සඳහා සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ නැවත ප්‍රකාශ කිරීම හෝ

(ආ) ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාල පරිච්ඡේදයට පෙර දෝෂය සිදුව ඇත්නම්, ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාල පරිච්ඡේදය සඳහා වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/ස්කන්ධයෙහි ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීම,

මගින් පූර්ව කාල පරිච්ඡේදයන්ට අදාල දෝෂයන් අතීතානුයෝගීව නිවැරදි කිරීමට සභාව විසින් කටයුතු කරනු ලැබේ.

මෙම වසර තුළ පෙර මූල්‍ය ප්‍රකාශනයේ යම් යම් දෝෂ සොයා ගත් අතර ඒවා 2022 මූල්‍ය ප්‍රකාශනවල නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කරන ලදී. දෝෂයේ ස්වභාවය හා 2022 දී පෙර ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රමාණ සහ නැවත ප්‍රකාශිත ශේෂයන් කෙරෙහි එහි බලපෑමේ පහත සාරාංශගත කර ඇත.

2022 වසරේ දෝෂ නිවැරදි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස්කම්වල බලපෑම.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇති බලපෑම

නැවත ප්‍රකාශිත අයිතමය	**ජර්නල් සටහන**	**නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය**	**ගැලපීම**	**නැවත ප්‍රකාශිත ශේෂය**
ආදායම				
2022 වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොළී ශේෂය	19,20 සහ 23	13,320,836.98	1,224,543.72	14,545,380.70
භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම	22	45,069,600.93	8946.96	45,078,547.89
වියදම්	**ජර්නල් සටහන**	**නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය**	**ගැලපීම**	**නැවත ප්‍රකාශිත ශේෂය**
වැඩසටහන් සඳහා වියදම්	18	49,709,582.20	5,422,067.00	55,131,649.20
පරිපාලන වියදම්	**20**	11,748,469.31	(11,799.40)	11,736,669.91
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය කෙරෙහි බලපෑම				
අයිතමය	**ජර්නල් සටහන**	**නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය**	**ගැලපීම**	**නැවත ප්‍රකාශිත ශේෂය**
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළීය	2.7.1	8,043,475.95	(157,740.69)	7,679,994.18
දේපල, පිරියත හා උපකරණ	2.7.2	1,918,738.56	1,155,069.23	3,073,807.79
ස්ථාවර තැන්පත්	19,20 & 23	185,167,086.79	1,382,914.41	186,550,001.20

03. 2023 වර්ෂය සඳහා රක්ෂණ සමාගම් වෙතින් ලැබුණු දායකත්වය

	සටහන් අංකය	2023	2022
		රු.	රු.
2023 වසර තුළ රක්ෂණ සමාගම් වලින් දායකත්ව ලැබීම් එකතු කළා	3.1	73,297,844.61	73,176,590.47
ලැබිය හැකි රක්ෂණ දායකත්වයේ වසර අවසාන ශේෂය		6,947,130.98	6,038,024.51
		80,244,975.59	79,214,614.98
අඩු කළා			
ලැබිය යුතු රක්ෂණ දායකත්ව ආරම්භක ශේෂයෙන්		6,038,024.51	7,037,439.32
		74,206,951.08	**72,177,175.66**

3.1 වසර තුළ රක්ෂණ දායකත්ව ලැබීම් (මූල්‍ය පදනම)

රක්ෂණ සමාගමේ නම	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
හැටන් නැෂනල් රක්ෂණ සමාගම	185,151.00	178,972.00	171,220.00	179,383.00	114,332.00	143,188.00	167,511.00	166,089.00	169,596.00	164,581.00	187,385.00	175,168.00	2,002,576.00
අමානා තකාෆුල් සමාගම	214,409.46	233,326.06	231,899.00	175,418.39	177,864.05	184,136.57	259,835.82	264,175.26	298,320.26	241,965.25	241,313.95	269,005.34	2,791,669.41
සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	782,406.00	864,040.00	783,705.00	813,254.00	581,372.00	668,634.00	616,930.00	755,908.00	809,247.00	691,091.00	847,888.00	753,320.62	8,967,795.62
එම් බී එස් එල් රක්ෂණ සමාගම	89,184.10	84,812.80	68,617.20	79,813.90	70,303.10	85,741.00	97,150.20	83,159.60	102,153.50	94,957.10	110,383.60	121,090.50	1,087,366.60
සමුපකාර රක්ෂණ සමාගම	940,852.00	902,715.00	824,428.00	793,798.00	467,471.00	173,461.00	664,055.00	891,337.00	1,135,444.00	905,906.00	1,101,544.00	1,115,430.18	9,916,441.18
ඔරියන්ට් රක්ෂණ සමාගම	81,380.56	251,037.76	183,510.52	136,443.48	110,787.68	146,257.12	151,553.08	176,700.00	179,132.36	205,742.92	155,818.52	157,381.60	1,935,745.60
සණස රක්ෂණ සමාගම	212,326.34		480,114.62	240,312.84	222,565.76	268,662.54	191,685.26	248,200.00	280,077.91	251,640.52	280,246.92	252,448.30	2,928,281.01
ආලියාන්ස් ලංකා සමාගම	472,480.00	463,275.00	442,105.00	481,275.00	338,410.00	423,640.00	404,120.00	465,955.00	492,600.00	446,500.00	545,850.00	492,586.00	5,468,796.00
ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	1,733,145.00	1,741,756.00	1,596,218.00	1,548,527.00	1,175,562.00	1,472,814.00	1,372,808.00	1,518,879.00	1,602,474.00	1,405,935.00	1,748,401.00	1,580,945.00	18,497,464.00
පීපල්ස් ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම	335,975.78	403,499.87	337,942.54	366,585.99	203,711.26	199,565.88	232,105.79	281,159.10	303,506.02	304,210.00	352,327.00	307,452.00	3,628,041.23
කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම	167,903.00	170,999.00	171,005.00	180,282.00	123,486.00	153,771.00	158,002.00	178,695.00	195,334.00	179,441.00	194,012.00	181,822.00	2,054,752.00
ලංකා ඔරික්ස් ලීසින් රක්ෂණ සමාගම	189,432.00	866,445.00	531,622.00	416,576.00	351,696.00	491,367.00	576,445.00	540,595.00	561,297.00	540,767.00	543,837.00	554,065.00	6,164,144.00
ජාතික රක්ෂණ භාර අරමුදල	58,413.27	53,366.72	55,114.09	238,767.91	49,002.66	49,756.41	41,449.58	52,171.83	43,922.56	35,876.00	57,384.30	48,747.63	783,972.96
ෆෙයාෆර්ස්ට් රක්ෂණ සමාගම	574,966.00	557,077.00	691,453.00	728,070.00	439,477.00	520,959.00	587,526.00	676,167.00	579,504.00	523,717.00	551,881.00	640,002.00	7,070,799.00
එකතුව	6,038,024.51	6,771,322.21	6,568,953.97	6,378,507.51	4,426,040.51	4,981,953.52	5,521,176.73	6,299,190.79	6,752,608.61	5,992,329.79	6,918,272.29	6,649,464.17	73,297,844.61

04. වෙනත් ආදායම්

	සටහන	2023	2022
		RS.	**RS.**
භාණ්ඩාගාර බිල්පත් පොලී		67,202,489.69	45,078,547.89
ස්ථාවර තැන්පතු පොලී		28,552,000.49	14,545,380.70
		95,754,490.18	59,623,928.59

05. වියදම්

5.1 පරිපාලන වියදම්

	2023	2022 (නැවත ප්‍රකාශ කළ)
	රු.	රු.
වැටුප් සහ වේතන	786,265.16	900,000.00
ඉන්දන දීමනාව	536,411.25	626,690.00
ප්‍රවාහන දීමනාව	487,096.77	300,000.00
දුරකථන දීමනාව	21,363.45	64,786.61
වෙනත් දීමනා	498,740.96	344,682.69
ඉන්දන හා ලිහිසි ද්‍රව්‍ය	600,000.00	604,076.00
සභා සහ කමිටු සාමාජික ගාස්තු	396,000.00	402,000.00
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව	358,685.64	469,534.65
වාහන නඩත්තුව	31,612.73	242,611.00
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	697,505.55	905,667.99
විදුලිය, දුරකථන සහ ජලය	246,335.49	251,274.46
පුවත්පත්	108,180.00	61,540.00
මුද්‍රණය සහ පරිවර්තනය	442,412.50	109,767.50
අතිකාල ගාස්තු	568,499.16	506,187.31
රැස්වීම් සඳහා සංග්‍රහ	106,796.00	92,794.65
විගණන ගාස්තු		
මෙම වසර සඳහා විගණන ගාස්තු	260,820.00	221,400.00
පෙර වර්ෂයේ ඌන (අධික) ප්‍රතිපාදන	60,820.00	
ගමන් වියදම් ගමන් වියදම්	112,714.00	142,436.00
ක්ෂය	1,247,764.35	810,629.91
තැපැල් ගාස්තු	24,085.00	44,855.00
බැංකු ගාස්තු	-	750.00
පුහුණුලාභී දීමනා	-	-
පිරිසිදු කිරීමේ ගාස්තු	776,999.99	732,400.00
විවිධ වියදම්	105,232.67	98,899.99
කාර්ය මණ්ඩල පුහුණුව	210,000.00	
NCRS පරිශ්‍රය ප්‍රතිසංස්කරණ	498,870.00	
පරිත්‍යාග		3,803,686.15
	9,183,210.68	**11,736,669.91**

5.2. මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා වියදම්

	සටහන	2023	2022
		RS.	RS.
මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන්	5.2.1.	20,779,309.68	38,031,649.20
හප්පා පළා යාම් සඳහා වන්දි		7,300,000.00	17,100,000.00
		28,079,309.68	**55,131,649.20**

මාර්ග ආරක්ෂාව පිලිබඳ ජාතික සභාව
2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

06. දේපළ, පිරියත සහ උපකරණ

	පරිගණක	ඡායාපිටපත් / මුද්‍රණ යන්ත්‍රය	ගෘහ භාණ්ඩ සහ උපාංග	වායු සමීකරණ	මාධ්‍ය උපකරණ	වෙනත් වත්කම්	ශීතකරණ	එකතුව
පිරිවැය / ප්‍රත්‍යාගණනය	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023.01.01 දිනට ශේෂය	1,155,069.23	887,300.00	702,472.50	556,559.44	1,577,412.50	79,981.50	133,000.00	5,091,795.17
වර්ෂය තුළ								-
එකතු කිරීම	2,559,200.00							2,559,200.00
බැහැර කිරීම්	-							-
2023.12.31 දිනට ශේෂය	**3,714,269.23**	**887,300.00**	**702,472.50**	**556,559.44**	**1,577,412.50**	**79,981.50**	**133,000.00**	7,650,995.17
සමුච්චිත ක්ෂය								
2023.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)		104,257.26	427,845.17	98,749.58	1,232,571.65	45,157.56	109,406.16	2,017,987.38
වසර සඳහා ගාස්තුව	809,371.69	110,912.50	70,247.25	69,569.93	154,071.46	9,997.69	23,593.84	1,247,764.35
බැහැර කිරීම්	-	-	-	-	-	-	-	-
2023.12.31 දිනට ශේෂය	**809,371.69**	**215,169.76**	**498,092.42**	**168,319.51**	**1,386,643.10**	**55,155.25**	**133,000.00**	**3,265,751.73**
31/12/2022 දිනට ශුද්ධ පොත් වටිනාකම	1,155,069.23	783,042.74	274,627.33	457,809.86	344,840.85	34,823.94	23,593.84	3,073,807.79
2023.12.31 දිනට	**2,904,897.54**	**672,130.24**	**204,380.08**	**388,239.93**	**190,769.40**	**24,826.25**	**-**	**4,385,243.44**

6.1 6.1 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ, පිරියත සහ භාවිතයේ ඇති උපකරණ
දේපළ, පිරියත සහ උපකරණ වලට ඇතුළත් වන්නේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වේ. වාර්තා කරන දිනට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල පිරිවැය/ප්‍රත්‍යාගණනය අනුව වටිනාකම.

07. හාණ්ඩාගාර බිල්පත්

බිල්පත් අංකය	2023/12/13 දිනට ආයෝජනය කළ මුදල	ලැබුණු පොලී ආදායම	2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම	2023 වර්ෂය සඳහා පොලී ආදායම
1	17,844,841.28	2,876,131.41	183,840.90	3,059,972.30
2	60,925,687.24	9,911,599.30	481,212.01	10,392,811.30
3	10,684,894.39	1,722,131.36	110,077.78	1,832,209.15
4	15,722,950.31	2,534,136.94	161,980.78	2,696,117.72
5	27,366,846.70	4,497,867.55	198,862.59	4,696,730.14
6	1,122,706.76	184,522.14	8,158.21	192,680.35
7	43,426,847.35	6,430,268.90	1,116,690.45	7,546,959.34
8	18,206,717.99	2,353,289.70	776,543.74	3,129,833.45
9	13,895,125.77	2,239,538.35	143,150.19	2,382,688.54
10	138,402,933.56	22,747,182.78	1,005,712.96	23,752,895.74
11	43,335,231.85	6,372,769.58	1,114,334.62	7,487,104.21
12	119,321.93	19,611.18	867.06	20,478.24
13	69,974.43	11,500.73	508.47	12,009.21
එකතුව	**391,124,079.56**	**61,900,549.94**	**5,301,939.75**	**67,202,489.69**

08. ස්ථාවර තැන්පතු

ර තැන්පතු	ගිණුම් අංකය	මුදල	**2023 වසර සඳහා පොලී ආදායම**	**2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම**
1	5052659	10,000,000.00	1,267,534.25	78,082.19
2	6462242	3,000,000.00	370,109.58	11,243.84
3	6061516	1,000,000.00	122,276.70	5,387.67
4	83251129	46,009,303.35	5,468,587.59	998,376.74
5	83250939	60,584,274.72	5,884,558.75	1,179,484.54
6	204-60-01-00023436-6	53,384,081.00	6,715,025.26	6,326,159.86
7	204-60-01-00026713-3	34,138,515.24	5,561,059.03	1,299,929.19
8	90785450	40,000,000.00	3,162,849.32	385,205.48
එකතුව		**248,116,174.31**	**28,552,000.49**	**10,283,869.50**

9 බැංකුවේ ඇති මුදල්		**2023**	**2022**
		රු.	**රු.**
	බැංකු ශේෂය	41,590,700.67	47,858,688.01
අඩු කළා	ඉදිරිපත් නොකළ ගෙවීම්	1,245,664.29	-
එකතු කළා	බැර නොවූ ලැබීම්	282,102.84	
	බැංකුවේ ඇති මුදල්	40,627,139.22	47,858,688.01

මාර්ග ආරක්ෂාව පිලිබඳ ජාතික සභාව

2023 දෙසැම්බර් 31 වන දිනට පිරික්සුම් ශේෂය

ගිණුමේ නම	බැර	හර
වත්කම්		
පරිගණක	3,714,269.23	
ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍රය	887,300.00	
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	702,472.50	
වායු සමීකරණ	556,559.44	
මාධ්‍ය උපකරණ	1,577,412.50	
අනෙකුත් වත්කම්	79,981.50	
ශීතකරණ	133,000.00	
සමුච්චිත ක්ෂය වීම		
පරිගණක		809,371.69
ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර		215,169.76
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්		498,092.42
වායු සමීකරණ		168,319.51
මාධ්‍ය උපකරණ		1,386,643.11
වෙනත්		55,155.25
ශීතකරණ		133,000.00
ස්ථාවර තැන්පතු	248,116,174.31	
භාණ්ඩාගාර බිල්පත්	391,124,079.56	
රක්ෂණ සමාගම් වලින් ලැබිය යුතු මුදල්	6,947,130.98	
අරමුදල් ගිණුම		573,742,286.80
රක්ෂණ සමාගම් වලින් දායකත්වය		74,206,951.08
ස්ථාවර තැන්පතු පොලී ගිණුම		28,552,000.48
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ගිණුම	10,283,869.50	
භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම		67,202,489.69
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම	5,301,939.75	
විගණන ගාස්තු		260,820.00
ගෙවිය යුතු ගාස්තු ගෙවීම	321,640.00	
වැටුප් සහ වේතන	786,265.16	
ඉන්ධන දීමනාව	536,411.25	
ප්‍රවාහන දීමනාව	487,096.77	
දුරකථන දීමනාව	21,363.45	
අනෙකුත් දීමනා	498,740.96	
ඉන්ධන සහ ලිහිසි තෙල්	600,000.00	
සභා සහ කමිටු සාමාජික ගාස්තු	396,000.00	
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව	358,685.64	
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	697,505.55	
දුරකථන ගාස්තු	246,335.49	
පුවත්පත්	108,180.00	
මුද්‍රණය සහ පරිවර්තනය	442,412.50	
අතිකාල ගාස්තු	568,499.16	
ගමන් වියදම්	112,714.00	
රැස්වීම් සංග්‍රහ	106,796.00	
විවිධ වියදම්	105,232.67	
ගාස්තු පිරිසිදු කිරීම	776,999.99	
NCRS පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම	498,870.00	
බැංකු ශේෂය	40,627,139.22	
කාර්ය මණ්ඩල පුහුණුව	210,000.00	
තැපැල් ගාස්තු	24,085.00	
වාහන නඩත්තුව	31,612.73	
වන්දි (හප්පා පලා යාම)	7,300,000.00	
පසුගිය උපචිත වියදම්		83,349.06
අවප්‍රමාණය	1,247,764.35	
වැඩසටහන් සඳහා වියදම්	20,779,309.68	
මුද්දර ගාස්තු ගෙවීම	-	
ගෙවිය යුතු මුද්දර ගාස්තු		200.00
	747,313,848.85	**747,313,848.85**

විගණකාධිපති වාර්තාව - 2023

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } COT/C/NCRS/2023/FA   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2024 මැයි 31 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ අංක 06 - දේපල, පිරියත හා උපකරණ වලට අදාල උපලේඛණයේ දක්වා තිබුණු රු.4,385,243ක් වටිනාකමින් යුතු කාණ්ඩ 7කට අදාල ස්ථාවර වත්කම්වල වටිනාකම් තහවුරු කර ගැනීම සඳහා ඊට අදාල විස්තරාත්මක උපලේඛණ හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින් එම ස්ථාවර වත්කම්වල වටිනාකම සහ ඊට අනුරූපී ක්ෂය වටිනාකම්වල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මගේ වාර්තාවේ 1.2 මතය සඳහන් පදනම කොටසේ විස්තර කර ඇති කරුණු විසින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණ පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනයන් සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වගෙන ගොස් තිබුණි.

ලබා ගන්නා ලද අතර. මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (l) (ඈ) (iii) වගන්තිය සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලබන නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂිමත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 110.	හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය.	ආයතනයට අදාළව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව පහත සඳහන් නිරීක්ෂණ හැර බලතල , කර්තව්‍ය සහ කාර්යන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2014 දෙසැම්බර් 12 වන දිනැති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 351 හි 10.6 වගන්තිය අනුව රටේ මාර්ග ආරක්ෂාව වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා මෙම ආයතනය ජාතික කොමිෂන් සභාවක් බවට පත් කර ඊට අවශ්‍ය බලතල, අධිකාරිය හා මූල්‍ය සම්පත් ලබා දීම, කොමිෂන් සභාවේ කටයුතු වලට සහය වීම සඳහා අවශ්‍ය සියලු අංගෝපාංග වලින් හා ඉහළ සුදුසුකම් සහිත පුහුණුවලත් කාර්යමණ්ඩලයකින් සමන්විත පූර්ණ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම කළයුතු වුවද, උක්ත විධිවිධාන ප්‍රකාරව මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් මෙම සභාවේ කාර්යන් ඉටුකිරීමට විධිමත් නෛතික බලයක් ලැබී නොතිබුණි.

(ආ) අංක 2245/31 හා 2021 සැප්තැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රක්ෂණ ආයතන 14ක් විසින් තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ ආදායමින් සියයට 02ක දායකත්වය ලෙස සභාවට ප්‍රේෂණය කර තිබුණු වටිනාකම රු.74,206,951 ලැබිය යුතු මුළු වටිනාකමද යන්න තහවුරු කර ගත හැකි ආකාරයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස්කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්යය මණ්ඩලය සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතු වුවද මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන් 14 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලය අනුයුක්ත කර අදාල රාජකාරි ඉටුකර ගෙන යමින් පැවතුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතීන්ට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

(අ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 (4) (ඇ) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පිළියෙල කර තිබුණු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.මිලියන 120 ක් වටිනා ක්‍රියාකාරකම් 31 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර කර තිබුණද, රු.මිලියන 51.51 ක වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 20 ක කිසිදු කාර්යසාධනයක් වාර්තා වී නොතිබුණි. සැලසුම්ගත කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 11ක අපේක්ෂිත ඉලක්කගත අරමුණු සැලසුම් කළ පරිදි ඉටු වී නොතිබුණු බවත්, එහි මූල්‍ය කාර්යසාධනයේ සාමාන්‍ය සියයට 10ක්

පමණක් බවත් නිරීක්ෂණය වූයෙන් ආයතනය විසින් 2023 වර්ෂය සඳහා සකස්කළ ප්‍රසම්පාදන සැලැස්ම අතාත්වික බවත්, එය කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත අරමුණු ලබාකර ගැනීම සඳහා කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ඇස්තමේන්තුගත මුළු ආදායම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු.මිලියන 114 ක් හා රු.මිලියන 119 වූ අතර සත්‍ය ආදායම රු.මිලියන 170 ක් හා සත්‍ය ප්‍රාග්ධන වියදම රු.මිලියන 28 වූයෙන් ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර රු.මිලියන 56 ක් එනම් සියයට 49 ක ධන විචලනයක් ද ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම හා සත්‍ය වියදම අතර රු.මි.91.20 ක් එනම් සියයට 76 ක සෘණ විචලනයක්ද නිරීක්ෂණය විය. ඒ අනුව සභාව විසින් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ඇ) ආයතනය විසින් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු (Pillars) 05 ක් යටතේ ක්‍රියාත්මක කළ යුතු රු.මිලියන 109.7 ක් වටිනා ව්‍යාපෘති 22 කට අදාළව කාර්යයන් 35 ක් හඳුනාගෙන සැලසුම්කර තිබුණද, රු.මිලියන 55.175 ක වටිනාකමින් යුතු කාර්යයන් 21ක් එනම් සියයට 50ක් සම්පූර්ණයෙන් ඉටු කර නොතිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා වී , 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු 01 යටතේ ක්‍රියාත්මක කර තිබූණු 3 වන ව්‍යාපෘතියෙහි 1 වන ක්‍රියාකාරකම ලෙස **"යතුරුපැදි අනතුරු අවම කිරීම"** සඳහා වන පර්යේෂණය සිදුකිරීමට විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයෙකු වෙත එකඟතා ගිවිසුමකට අනුව භාර දී තිබුණි.එම පර්යේෂණය අදියර 4ක් යටතේ සිදුකර 2022 වර්ෂය තුළ අවසන් කර භාර දීය යුතුව පැවතිය ද,එදිනට අවසන්කර භාර දී නොතිබුණු අතර, 2023 වර්ෂයේ දී අදියර 2 ක් පමණක් සම්පූර්ණ කර වාර්තාවක් සභාවට ලබා දී තිබුණි. මේ වනවිට පර්යේෂණයේ ඉතිරි අදියර 2 ක ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් පැන නැගී ඇති අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් දරා තිබූ රු.700,000 ක මුදල නිශ්කාර්ය වී තිබුණි. තවද,ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමේ අවිනිශ්චිතතාවය හා එකඟතා ගිවිසුමද කඩවීම සම්බන්ධයෙන් ආයතනය විසින් පියවර ගෙන නොතිබුණි.

ii. ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු 01 යටතේ 5 වන ව්‍යාපෘතිය ලෙස මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන නිලධාරියෙකු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පත් කර ඔවුන්ට කාර්යභාරයන් පවරා පළාත් මට්ටමෙන් පුහුණු වැඩසටහන් පවත්වා ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක වන මාර්ග ආරක්ෂණ කමිටුව සමඟ මෙම නිළධාරීන් සම්බන්ධ කිරීමට 2022 වර්ෂයේදී රු.143,055ක වියදමක් ද දරා තිබුණු නමුත් ආයතනික හා මූල්‍ය ගැටළු

යටතේ එය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් ද මෙම යෝජනාව ඉවත් කර තිබුණෙන් e-පුස්තකාලය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ දැනට පවතින ස්ථාවර වත්කම් වලින් සැළකියයුතු ප්‍රමාණයක් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ භාවිත කර පසුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට ලබාදුන් වත්කම් වන අතර ඇතැම් වත්කම් වර්ෂ 10ට පමණ ඉහත දි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙනුවෙන් ප්‍රවාහන හා මහාමාර්ග ආමාත්‍යාංශය විසින් මිලට ගත් වත්කම් වේ. මෙම වත්කම් වල වටිනාකම් සඳහන් ස්ථාවර වත්කම් ලේඛනයක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතුව නොමැති අතර පෙර වසරේ අවසන් ගිණුම්වල සඳහන් වූ අගයන්ට නව මිලදී ගැනීම් තුළින් වැඩිවන වටිනාකම් ගළපමින් ඉදිරියට ගෙනෙන ලද වටිනාකම් 2023 අවසන් ගිණුම් ද තුළ ඇතුළත් කරන ලදි.
තවද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර යාවත්කාලීන වටිනාකම් හඳුනා ගැනීමටත් වත්කම් වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් එම තොරතුරු මත පදනම්ව සකස් කිරීමටත් කටයුතු කරන බව මින් පෙර 2023 විගණන වාර්තාවෙහි කෙටුම්පත් වාර්තාව සඳහා පිළිතුරු ලෙස සඳහන් කරන ලදී.
ඒ අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රත්‍යාගණන කමිටුවක් මේ වනවිට පත්කර ඇති අතර, ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

2.2.2.

(අ) හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව මේ වනවිට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් හානි පිළිබඳ ලේඛනයක් සකස් කර ඇත. මේ වන තෙක් එහි වාර්තා කිරීම සඳහා හානි පාඩු වාර්තා වී නොමැත.

(ආ) තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැති අතර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් 2022-2024 වර්ෂයන් සඳහා වන තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරන ලද අතර, එය මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දශකය සඳහා වන එක්සත් ජාතීන්ගේ මාර්ග ආරක්ෂණ සහයෝගීතාව විසින් යෝජිත

- 01 වැනි කුළුණ : මාර්ග ආරක්ෂණ කළමනාකරණය
- 02 වැනි කුළුණ : ආරක්ෂිත මාර්ග සහ සංචලනය
- 03 වැනි කුළුණ : වඩා ආරක්ෂිත වාහන
- 04 වැනි කුළුණ : වඩා ආරක්ෂිතව මාර්ග භාවිතා කරන්නන්
- 05 වැනි කුළුණ : පශ්චාත්-අනතුරු ප්‍රතිචාර

යන කුළුණු පහකින් යුත්ත ප්‍රවේශය මත පදනම්වේ. තවද, මාර්ග ආරක්ෂාව නියෝජනය කිරීම සඳහාම වූ විශේෂ තිරසාර සංවර්ධන ඉලක්කයක් නොමැති වුවද, තිරසාර සමාජ-ආර්ථීක සංවර්ධනය වෙනුවෙන් ස්ථාපිත මාර්ග ආරක්ෂාව ආශ්‍රිත ඉලක්කයන් වන පහත වගුවේ දක්වා ඇති තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම්ව දේශීය විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් එකී ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

තිරසාර සංවර්ධන අරමුණු	ප්‍රවාහන අංශයට අදාළ ඉලක්කය
3 වැනි අරමුණ : යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම	**3.6වැනි ඉලක්කය** මාර්ග අනතුරු වලින් සිදුවන වන ගෝලීය මරණ හා තුවාල සංඛ්‍යාව අඩකින් අඩු කිරීම
11 වැනි අරමුණ: තිරසාර නගර සහ ප්‍රජාවන්	**11.2 වැනි ඉලක්කය** 2030 වන විට, අවදානමට ලක්විය හැකි පුද්ගලයින්, කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වැඩිහිටි පුද්ගලයින්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, විශේෂයෙන් පොදු ප්‍රවාහනය පුළුල් කිරීමෙන් මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කරමින් සැමට ආරක්ෂිත,දැරිය හැකි,ප්‍රවේශ විය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධති සඳහා ප්‍රවේශය ලබා දීම.

2024 වර්ෂය සඳහා තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැත. 2025 වර්ෂයේදී සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට නියමිතයි.එහිදී තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීමට හැකියාව ඇති බවත්, ඒ අනුව කටයුතු කරන බවත් දන්වා සිටිමි.

2.2.3.

(අ) මාර්ග අරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් සකස් කරන ලද අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කාර්යය තාවකාලිකව නවතා දමන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2023 වර්ෂයේදී දන්වන ලදි.
එම පනත් කෙටුම්පත 2024 වර්ෂයේදී නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ නීති අංශය මඟින් කටයුතු කරන ලදි.නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාල කෙටුම්පත් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ විමසා තිබූ අතර, අදාළ නිරීක්ෂණ නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති බව ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ නීති අංශය විසින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත දැනුම් දී ඇත.

(ආ) රක්ෂණ ආයතන වෙතින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබෙන රක්ෂණ දායකත්ව මුදලෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා නියමිත වැඩපිළිවළක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හා රක්ෂණ ආයතන සමඟ සාකාච්ජා කළද, එම මුදල තහවුරු කර ගැනීම සඳහා වන තොරතුරු නිසි පරිදි ලබා දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතුවද නිසි තොරතුරු නොමැති බව දන්වන ලද බැවින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ, රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ හා රක්ෂණ ආයතනවල එකඟතාවය මත මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් රක්ෂණ ආයතන වෙත ලබා දී ඇති ආකෘති පත්‍රය අදාළ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගෙන් හෝ ප්‍රධාන මූල්‍ය නිලධාරීගෙන් තහවුරුවක් සහිතව මාසිකව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

එහෙත් මේ සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙළක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ලෙස රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා ආරම්භ කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) මාර්ග අරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් සකස් කරන අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කාර්යය තාවකාලිකව නවතා දමන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් දන්වා ඇත. එම පනත් කෙටුම්පත 2024 වර්ෂයේදී නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.තවද,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා DMS/1855 2024.01.08 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු හා DMS/1855 2024.04.19 දිනැති ලිපිය මඟින් අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ(තාක්ෂණ) හා ගණකාධිකාරී යන තනතුරු අනුමත කර ඇත.

2.2.4. (අ), (ආ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපති ධුරය 2023.01.23 දින සිට 2023.03.09 දින දක්වා හිස්ව පැවති අතර, ජාතික සභාවේ සභා සාමාජිකයින්ගේ ධුර කාලය 2023.01.28 දිනෙන් අවසන් වීමෙන් අනතුරුව 2023.03.16 දින නව සභා සාමාජිකයින් පත් කිරීම සිදුවිය. 2023.03.16 දින මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා රැස්වීමෙන් අනතුරුව නැවත මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.මේ හේතුවෙන් 2023 පළමු කාර්තුව සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීමට නොහැකි විය.

2023.06.16 දින පැවති ජාතික සභා රැස්වීමේදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කිරීමට කටයුතු කරන ලදි.2023.08.09 දින එම සංශෝධිත සැලසුම් සඳහා ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කලද අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැසම,ප්‍රසම්පාදන සැලැස්මට හා අයවැය ලේඛනයට සංශෝධනයන් එක් කරමින් 2024 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනය සකස් කරන ලදි.

තවද 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ ව්‍යාපෘති අතරින් ප්‍රායෝගිකව මෙම වසර තුළදී ක්‍රියාත්මක කිරීමට අපහසු වන බවට හැඟීගිය ව්‍යාපෘති ඉවත් කර 2024 ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.

2025 වර්ෂයේදී පෙර වර්ෂයේ සිදුවූ ගැටළු අවම කරගනිමින් වඩාත් කාර්යක්ෂම අයුරින් එම සැලසුම් මගින් අපේක්ෂිත කාර්ය සාධනය ලඟා කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) i. 2023 වර්ෂය අවසන් වන විට යතුරුපැදි අනතුරු සම්බන්ධයෙන් වන පර්යේෂණ කාර්යයයෙහි අදියර 2 ක් සම්පූර්ණ කර එහි වාර්තාවන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබී ඇති අතර එහි ඉතිරි අදියර 2 ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ විශ්ව විද්‍යාල ආචාර්යවරයා විදෙස් ගතවී ඇති හෙයින් අපොහොසත් වී ඇත.එහෙත් 2024 වර්ෂය වන විට අදාළ ආචාර්යවරයා විසින් ඉතිරි වාර්තා දෙකෙන් එක් වාර්තාවක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත යොමු කර ඇත.මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ජාතික සභාවෙන් විමසීමට කටයුතු කරන ලදි.එහිදී ඉතිරි වාර්තාවද ලබා ගැනීමට කටයුතු කරන ලෙසට ජාතික සභාව විසින් යෝජනා කරන ලදි.ඒ අනුව අදාල වාර්තාව ලබා දෙන ලෙසට එම ආචාර්යවරයාට දැනුම්දීමෙන් අනතුරුව එකී වාර්තාවද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබී ඇත.ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජාතික සභාවෙන් නැවත විමසීමෙන් අනතුරුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

ii. මාර්ග ආරක්ෂාව හා මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන නිලධාරියෙකු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පත් කර ගැනීමේ අරමුණින් 2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.ඒ සඳහා දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 256 කින් 2022 වර්ෂයේදී නාමයෝජනා ලැබී තිබුනි.
ලැබී තිබූ නාම යෝජනා අතුරින් බස්නාහිර පළාතට අයත් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය කරන නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහනක් 2022.11.22 දි ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි.අදාළ වැඩසටහනට සහභාගීවූ නිලධාරීන් හට තම රේඛීය අමාත්‍යාංශයෙන් නියම කරන ලද රාජකාරි ලැයිස්තුව මගින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු වැළැක්වීම සඳහා කටයුතු කිරීම සඳහා වන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ රාජකාරි ඉටු කිරීම සඳහා බලය ලබා දී නොමැති බවත්, මේ සඳහා සහය ලබා දීමට ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙස මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙන් ඉල්ලීම් කරන ලදි.
ඒ අනුව මේ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළ අතර ඒ සඳහා එකඟතා ගිවිසුමක් අත්සන් කිරීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නම් කරන නිලධාරියා සඳහා යම් දීමනාවක් ගෙවීම සුදුසු බවත් යෝජනා කරන ලදි.ඒ අනුව මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමග එක්ව කටයුතු කිරීම සඳහා ස්ලීඩා ආයතනයේ සහයෝගයද ඇතිව එකඟතා ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කරන ලදි.කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ අපහසුව මත එම ව්‍යාපෘතිය නවතා දැමීමට ජාතික සභාව විසින් 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී කටයුතු කල බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) 2023.06.16 දින පැවති ජාතික සභා රැස්වීමේදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කිරීමට කටයුතු කරන ලදි.2023.08.09 දින එම සංශෝධිත සැලසුම් සඳහා ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කළද අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැසම,ප්‍රසම්පාදන සැලැස්මට හා අයවැය ලේඛනයට සංශෝධනයන් එක් කරමින් 2024 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනය සකස් කරන ලදි.

තවද 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ ව්‍යාපෘති අතරින් ප්‍රායෝගිකව මෙම වසර තුළදී ක්‍රියාත්මක කිරීමට අපහසු වන බවට හැඟීගිය ව්‍යාපෘති ඉවත් කර 2024 ක්‍රියාකාරී සැලැස්ම 2024.06.20 දින සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් කටයුතු කරන ලදි.

2025 වර්ෂයේදී පෙර වර්ෂයේ සිදුවූ ගැටළු අවම කරගනිමින් වඩාත් කාර්යක්ෂම අයුරින් එම සැලසුම් මඟින් අපේක්ෂිත කාර්ය සාධනය ලඟා කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී මින් ඉදිරියට ව්‍යාපෘති සුවිශේෂී ලෙස දැක්වීමටත්, වර්ෂය ආරම්භ වීමට පෙර හඳුනාගැනීමට නොහැකි වූ අත්‍යාවශ්‍ය ලෙස ක්‍රියාත්මක කළයුතු යම් ව්‍යාපෘතියක්/ව්‍යාපෘති සඳහා යෝජනා ඉදිරිපත් වුවහොත් අවශ්‍ය පරිදි එකී සැලැසුම් සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
2022 හා 2023 වර්ෂයන් සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලසුම්වල කුළුණු අංක 04 යටතේ දක්වා තිබූ "පාපැදි කරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම" යන ව්‍යාපෘතියට අදාලව 2023 මාර්තු මාසයේදී ප්‍රසම්පාදන කටයුතු අවසන් කර පාපැදිවල ඇලවීම ස්ටිකර් මිලදී ගැනීම සඳහා රු.2,650,000 ක වියදමක් දරා තිබියදී අදාළ ස්ටිකර් බෙදාදීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමේ අපේක්ෂාව ඇතිව එම ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇතත් එලෙස ව්‍යාපෘතියේ කටයුතු 2024 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අවස්ථාවේදීද සිදු නොවී ඇති බව පෙනීගිය නිසාත් අදාළ දෝෂය නිවැරදි කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.

(ඊ) 2021.02.10 වන දින පැවති නම වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 06 හි පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 10 වන රැස්වීමේදී ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණවල පවතින අඩුපාඩු සම්බන්ධයෙන් සාකච්ඡා වී ඇති අතර, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු අරමුදලින් එම උපකරණ මිලදී ගැනීමට ඇති හැකියාව සමබන්ධයෙන් කාරක සභාව මඟින් විමසීම

කර ඇත.ඊට මුදල් වෙන් කළ හැකි බව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් සඳහන් කර ඇත.ඒ අනුව, 2021.05.17 දින ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා මහජන ආරක්ෂක අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකා පොලිසිය වෙත,

- ලේසර් ටෘකැම් වේග මාපක යන්ත්‍ර 100 (කොට්ඨාශයකට දෙක බැගින් සහ අනතුරු බහුල පොලිස් වසම් 12 ක් සඳහා)
- අඳුරු වීදුරු පරීක්ෂා කිරීමේ ඉලුමිනස් මීටර් යන්ත්‍ර 50
- තිරිංග පරීක්ෂා කිරීමේ ටැප්ලි මීටර් 50
- ශබ්දය පරීක්ෂා කිරීමේ නොයිස් මීටර් 5

රු.මි.150 ක් දරා ලබා දීම සඳහා ගිවිසුමක් අත්සන් කර ඇත.

2023 ක්‍රියාකාරී සැලැස්මෙහි රු.මි.150 ක් වෙන්කර තිබූ මෙම ව්‍යාපෘතිය 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අවස්ථාවේදී අවසන් වී නොතිබූ අතර, 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එම ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීමට ජාතික සභාව විසින් කටයුතු කරන ලදි. 2024 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අධික වේගයෙන් රිය ධාවනය කරන රියදුරන් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා දීම යන ව්‍යාපෘතිය මඟින් මේ සඳහා රු.මි.50 ක් වෙන් කරන ලදී.

ඒ අනුව, පෙර පැවති ගිවිසුම සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසීමක් කරන ලද අතර, 2024 වර්ෂයේදී රු.මි. 50 ක් සහ ඉදිරි වසර දෙක තුළදී රු.මි.100 ක මුදලත් අදාල ව්‍යාපෘතිය සඳහා ලබා ගැනීම සඳහා එකඟ වන බව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත දන්වා ඇත.ඒ අනුව අදාල රු.මි.50 ක මුදල 2024 වර්ෂයේදී ලබාදීම සඳහා නව ගිවිසුමක් සකස් කළ අතර, ඒ සඳහා ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත.එම ගිවිසුම සඳහා වන නිරීක්ෂණ ලබා ගැනීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.

(උ) 2021 වර්ෂයේදී ස්ථාපිත කරන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම හා ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය 2023 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබුණද 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවීම සම්බන්යෙන් සිදුවී ඇති දෝෂය 2024 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී හඳුනාගෙන 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි.තවද,ඉදිරියේදී විද්‍යුත් පුස්තකාලය පිහිටුවීමේ අරමුණු ඉටුවන පරිදි එය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමටත්, ඒ සම්බන්ධයෙන් ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් කිරීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

එච්.ඩී.ආර්.කුමාරි ජයරත්න
සභාපති
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව